විශ්‍රාමික සැරයන්වරයෙකුගේ දියණියක් නිවසින් පැහැර ගැනීමක් පිළිබඳ සිදුවීමක් ජනවාරි 11, 2022 දින අරුණ, මව්බිම, ලංකාදීප, දිවයින පුවත්පත් වාර්තා කර තිබුණි. එදින මෙම පුවත දිනමිණ පුවත්පත වාර්තා කර නොතිබුණි. මෙම පුවත් වාර්තා හතරේම පැහැරගැනීමට
ලක්වූ තරුණිය "රූමත්" යැයි දක්වා තිබුණි.

1) පැහැර ගැනීමට ලක්වූ තරුණියකගේ බාහිර පෙනුම "රූමත්" ලෙස විස්තර කරමින්, ඇගේ බාහිර රූපය ඉස්මතු කිරීම පුවතට අදාළ වන්නේද?

2) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ඒකාකෘත කිරීම් ප්‍රවර්ධනයක් කිරීමක් නොවන්නේද?

3) එසේ නම්, "රූමත්" වැනි යෙදුම් ඔස්සේ බාහිර රූපය හුවා නොදක්වමින් පවා, පුවතෙහි අන්තර්ගතයට බලපෑමක් නොවන අයුරින් පහත දැක්වෙන පුවත් ඉදිරිපත් කිරීමට හැකි නොවන්නේද?